---

**පදවිය ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුලි 01 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

-------

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පදවිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතු ස්ථාවර වත්කම් විෂයයන් 19 ක් අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). සභාව විසින් ඉදිකරන ලද පිරිවැය රු.2,000,000 ක් වූ පුස්තකාල ගොඩනැගිල්ලෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ ආදායම ගණනය කිරීම සඳහා පිළියෙල කළයුතු සාරාංශ ආදායම් ලේඛණය (ප්‍රා.ස 19) පිළියෙල කර නොතිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පැවති රු.486,839 ක්වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 43,147,714 ක්වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

--------------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,815 ක්වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.479,074 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

----------------

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 99 පරිදි සියළුම ගෙවීම් වවුචර් සභාවේ සභාපතිවරයා විසින් සහතික කළ යුතු වුවත් එපරිදි කටයුතු නොකර වවුචර් 12 ක් වෙනුවෙන් එකතුව රු.220,036 ක් ගෙවා තිබුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති අංක 180 ප්‍රකාරව මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් හෝ ආදායම් පිළිබඳ රාජකාරි ඉටු කරන නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | ව්‍යාපාර බදු | 225 | 79 | 146 |
| (ii). | බදු කුලී | 1,365 | 802 | 563 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 370 | 487 | 117 |
| (iv). | වෙනත් ආදායම් | 2,077 | 1,506 | 571 |

**2.3.2 ව්‍යාපාර බදු**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ආදායමින් සියයට 65 එනම් රු.145,600 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදුකුලී**

(අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු බදුකුලී ආදායමින් සියයට 41 ක් එනම් රු.563,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභාව සතු කඩ කාමර 02 ක් බදු පදනම මත ලබා නොදීම නිසා සභාවට අවම වශයෙන් රු.87,600 ක ආදායමක් අහිමි වී තිබුණි

### 2.3.4 බලපත්‍ර ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු නිශ්චිතව ඇස්තමේන්තු නොකිරීම මත ඇස්තමේන්තු ප්‍රමාණයට වඩා තථ්‍ය ආදායම රු.487,000 ක් එනම් සියයට 32 ක් වැඩිපුර ලැබී තිබුණු බව නිරූපනය වේ.

### 2.3.5 වෙනත් ආදායම්

-------------------

1988 අගෝස්තු 23 දින අංක 520/07 දරන පළාත් පාලන අමාත්‍යවරයාගේ අති විශේෂ ගැසට් නිවේදනයේ අතුරු ව්‍යවස්ථා අංක 39 ප්‍රකාරව ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරුවල ප්‍රමාණය මත ගාස්තුවක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු |
|---|---|---|
| (i). | උසාවි දඩ | 1,257,910 |
| (ii). | මුද්දර ගාස්තු | 221,400 |

### 2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

----------------------------------------------------

සභාව සතු රු.35,000 ක් වටිනා යුගල බෝට්ටු 02 ක් වසර 03 කට අධික කාලයක් පුරා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රියව පැවතුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු එහෙත් එවැනි අනුමැතියක් ලබා ගැනීමකින් තොරව උත්සව සඳහා එකතුව රු.10,000 ක ගෙවීම් කර තිබුණි.

**2.6 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් ක්‍රියාත්මක කරන ලද එකතු පිරිවැය රු.3,132,099 ක්වූ කර්මාන්ත 03 කට අදාල ගෙවීම් කිරීමේදී පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන සහතික ලබාගෙන නොතිබුණි.

(ආ). 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 වගන්තිය පරිදි සැපයුම්කරුවන් අතර පොදු තරඟකාරිත්වයක් ඇති කර ආයතනයට වැඩි වාසිදායක ලෙස භාණ්ඩ හා සේවා ලබා ගැනීම සිදු කළ යුතු වුවත් සභාව විසින් රු.239,340 ක් වටිනා භාණ්ඩ මිලට ගත් අවස්ථා 07 කදී එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුල වැඩ නිම කිරීමට සැලසුම් කර තිබුණු ගිවිසුම්ගත පිරිවැය රු.6,918,062 ක් වු කර්මාන්ත 04 ක් වර්ෂ අවසාන වනවිටත් වැඩ නිම නොකර තිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අධීක්ෂණයක් සිදුවූ බවටද සාක්ෂි අනාවරණය නොවුණි.

(ආ). 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති අංක 203 හා 214 හි විධිවිධාන ප්‍රකාරව 2010 වර්ෂයෙන් පසුව සභාවේ දේපල ගබඩා සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

(ඇ). නිකුත් කර මාස 06 ක කාලයක් තුළ ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු.10,674 ක්වූ චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) පරිදි කටයුතු කර නොතිබුණි.

(ඈ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි

(ඉ). සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවූ සේවකයන් 11 දෙනෙකු සේවයේ යොදවා ප්‍රතිපූර්ණය නොවන වැටුප් වශයෙන් රු.785,981 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**2.8 සනඅපද්‍රව්‍ය කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් පරිසර හිතකාමී කසල කළමනාකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අභ්‍යන්තර පාලනය.
(ඇ). ආදායම් පරිපාලනය.
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). කොන්ත්‍රාත් පරිපාලනය.